# කොවිඩ් 19 සති පාසල සබරගමු පළාත.
## නිවිතිගල අධ්‍යාපන කලාපය.
## 9 - ශ්‍රේණිය - - ඉතිහාසය -2021-පළමු වාරය

පැවැරුම :- 02 වන සතිය (2021.01.10 සිට 2021.01.16 දක්වා)

ඒකකය 01 :- **ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසි යටතට පත්වීම.**

ක්‍රියාකාරකම :- **ලන්දේසි හා උඩරට රාජධානිය අතර පැවැති සබඳතා පිළිබඳ සොයා බලමු.**

හැඳින්වීම :- ලන්දේසීන් පෙරදිග ප්‍රදේශ වලට පැමිණෙන අවධියේ පෙරදිග ප්‍රදේශවල බලය මෙහෙයවූ යුරෝපීය කණ්ඩායම වන්නේ පෘතුගීසීන් ය. පෘතුගීසීන් මේවන විට ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ වලද පාලනය මෙහෙයවා ඇත. එවකට උඩරට පැවැතියේ ස්වාධීන පාලන ඒකකයකි. උඩරට පාලකයින් හට මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ පෘතුගීසීන් දැඩි හිසරදයක්ම පැවතින. එහි ප්‍රතිඵලය වූයේ උඩරට පාලකයින් ලන්දේසි සහය සොයා යාමට පෙළඹීමය.

සිසු උපදෙස් :-

*පියවර 01* පසුගිය සති පාසල් පැවැරුම අවසන් වූ තැනින් ඉහතින් දක්වා ඇති හැඳින්වීම සටහන් කර ගන්න.

*පියවර 02* පෙළපොතේ පිටු අංක 03 සිට 05 දක්වා හොඳින් කියවා ගන්න.

*පියවර 03* පෙළපොතේ පිටු අංක 03 සිට 05 දක්වා උපකාරී කරගෙන පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

***ප්‍රශ්නාවලිය***

(පිළිතුරු ලිවීමට පෙර අදාළ ප්‍රශ්නය සටහන් කර ගැනීමට කටයුතු කරන්න)

01) ලංකාවට පැමිණි ප්‍රථම ලන්දේසි දූතයා නම් කරන්න.

02) ලංකාවට පැමිණි ප්‍රථම ලන්දේසි දූතයා මෙරටට ගොඩ බෑ වරාය හා පැමිණි වර්ෂය ලියා දක්වන්න.

03) ප්‍රථම ලන්දේසි දූතගමන සිදුවන අවධියේ මෙරට උඩරට පාලකයා කවුරුන් ද

04) ප්‍රථම ලන්දේසි දූතගමනින් මාස තුනකට පසු මෙරටට දෙවන ලන්දේසි දූතගමන සිදුවිය. එහි ප්‍රධානියා නම් කරන්න.

05) දෙවන ලන්දේසි දූතගමනින් පසු එම සබඳතා බිඳවැටීමට හේතු ලියා දක්වන්න.

06) පළමුවන විමලධර්මසූරිය රජුගෙන් පසු උඩරට බලයට පත් වූ පාලකයා වන්නේ.

07) ක්‍රි.ව. 1638 ලන්දේසින් සමග ගිවිසුම්ගත වූ රජු නම් කරන්න.

08) එම 1638 ගිවිසුමේ කොන්දේසි ලියා දක්වන්න.

සැකසුම :- උදාර අරවින්ද
නිවිතිගල කලාප කාර්යාලය
ර/කලවාන ජාතික පාසල